# උග්ගල්බඩ මල් අස්නේ රජමහා විහාරය සහ දෙවොල් මඩුව

කේ.ඩී.සී. සෙව්වන්දි[1]

උග්ගල්බඩ මල් අස්නේ රජමහා විහාරයේ ප්‍රවේණික ඉඩම් භුක්තිය හා බැඳුණු සමාජීය හා ආර්ථික ලක්ෂණ, විහාරය ආශ්‍රිතව ඇති මහා දෙවොල් මඩුව හා බැඳුණු සමාජීය ලක්ෂණ ඓතිහාසික හා වර්තමාන දත්ත ඇසුරෙන් සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම මල් අස්නේ රජමහා විහාරය පිහිටා ඇත. එම විහාරයෙහි ඉඩම් පරිභෝජනය සහ සමාජ සම්බන්ධතා හේතුවෙන් විශේෂිත ලක්ෂණ පෙන්නුම් කරයි. සාහිත්‍ය මූලාශ්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි හා අන්තර්ජාල තොරතුරු ඇසුරෙන් මෙම සාධක පිළිබඳව පර්යේෂණය සිදුකර ඇති අතර වාර්තාකරණ ක්‍රමවේදයක් තුළ ඡායාරූපගත කිරීම සිදු වේ. විහාරාධිපති ස්වාමීන්වහන්සේ මෙන්ම විහාරයට සම්බන්ධ පුද්ගලයන් සහ කපු පරම්පරාවලට සම්බන්ධ වූවන් මෙහි දත්ත දායකයන් ලෙස සම්බන්ධ කර ගන්නා ලදී. මෙම අධ්‍යනයේ දී අනාවරණය වනුයේ වටුතන්ත්‍රිය තඹ සන්නස අනුව හා දෙවොල් මඩුවේ කණුවක වසර 100 කට පමණ පෙර ලියවුණු බවට සැළකිය හැකි ලිපියක මෙම දේවාලය ශක වර්ෂ 1443 දී හය වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් විහාරයට හා දේවාලයට අදාළ විධිවිධාන නැංවීම පිළිබඳ සඳහන් වන අතර ඒ ආශ්‍රිත ඉඩම් ද ඒ සමඟම පූජාකර තිබේ. පෘතුගීසීන් විසින් මෙම විහාර තදාශ්‍රිතයේ උක් වගාවක් සිදු කිරීම පිළිබඳ ජනප්‍රවාදගත සඳහනක් පැවතුණ ද ඒ පිළිබඳව තහවුරු කිරීමෙහි මූලාශ්‍රයක් නොමැත. වර්තමාන විහාරයේ එකොළොස් වැනි විහාරාධිපති වන පූජ්‍ය පරගස්තොට රේවත හිමිට අනුව මෙම විහාරස්ථානය සතු ඉඩම්වල මායිම් වන අඩහනගල, දලුග්ගල, බිම්ගල හා මල් අස්නේ ගල සතර දිගින් සීමා මායිම් වූ බව සඳහන් කරති. පුරාවිද්‍යා ස්මාරකයක් වශයෙන් ද නම්කර ඇති දෙවොල් මඩුව ශ්‍රී ලංකාවේ ප්‍රථම දෙවොල් මඩුව වශයෙන් සැළකේ. වර්ෂ 1928 මාර්තු මස 17 වැනි දින සිට අප්‍රේල් 11 වැනි දින දක්වා සෙනසුරාදා හා බදාදා යන කෙම්මුර දින හතේදී දෙවොල් මඩු ශාන්තිකර්මය පැවැත් වී ඇතිමුත් වර්තමානයේ මෙය දින දෙකකට පමණක් සීමා වී ඇත. ගල්කිස්සේ ඇති ප්‍රධාන දෙවොල් මඩුවත්, උග්ගල්බඩ දෙවොල් මඩුවත් සම්ප්‍රධායන්ගෙන් හා පරම්පරාවෙන් සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. මෙම දෙවොල් මඩු දෙකම වටුතන්ත්‍රිය පරපුරට අයත්ව පැවති අතර පසුකාලීන විවාහ සබඳතා හේතුවෙන් උග්ගල්බඩ දෙවොල් මඩුවේ භාරකාරත්වය මොරෙස් පරම්පරාවට හිමි විය. සියවස් ගණනාවක් පුරාවට විහාරස්ථානයත්, දේවාලයත් පරම්පරාගත උරුමයකින් පැවතෙන අතර අවියෝජනීය සම්බන්ධයක් පවතින බවත් මේ අනුව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : මල්අස්න රජමහා විහාරය, දෙවොල් මඩුව, පරම්පරාගත ප්‍රවේණිය, සන්නස්,

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.kdcsewwandi1997@gmail.com